ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය - නීතිවේදී දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව - හයවන මට්ටම

පළමු අඛණ්ඩ ඇගයුම් පරීක්ෂණය 2022/2023

දිලික්ත නීතිය **LWU 4326 / LLU6814**

කාලය - පැය 1 යි.

---

දිනය: 2023 සැප්තැම්බර් 25 | වේලාව: ප.ව.3.30-4.30

---

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

අවසර නොලත් ලිපි ලේඛන හෝ ජංගම දුරකථන විභාග ශාලාවේ තබාගැනීම විභාග වරදකි.

එක් ප්‍රශ්නයක් සඳහා පමණක් පිළිතුරු සපයන්න.

1. 'එක්තරා යුගයක නීතිය වූයේ පූර්වේක්ෂණය කල නොහැකි වීම විත්තිවාචකයක් නොවන බවය (*Re polemis* නඩුව). එහෙත් තත්කාලීන නීතිය වන්නේ හානිය පූර්වේක්ෂණය කල හැකි ආකාරයේ එකක් නොවේ නම්, වගකීමක් උද්ගත නොවන බවය (වැගන් මවුන්ඩ්, අංක 1 නඩුව). හානිය සඳහා වූ වගකීම වර්තමානයේ පදනම් වන්නේ පූර්වේක්ෂණය නම් සංකල්පය මතය. සිදුවිය හැකි හානිය සාධාරණ මිනිසෙක් විසින් සැබෑ අවදානමක් ලෙස පෙර දැකිය යුතු වූවක් වන අතර, අවදානම කෙතරම් සුලු ද යත් සාධාරණ මිනිසෙක් විසින් නොතකා හරිනු ලැබීම සාධාරණ යැයි සිතන ආකාරයේ සිදුවීම් විසින් වගකීම උද්ගත නොකරයි'.

   ශර්වානන්ද විනිසුරු, *Collettes Ltd.* v. *Bank of Ceylon* [1984] 2 Sri LR 253 at 300.]

   *Re Polemis* සහ *The Wagon Mound 1* යන නඩු ආශ්‍රයෙන් මෙම ප්‍රකාශයේ නිරවද්‍යතාවය සාකච්ඡා කරන්න.

2. බොහෝ රටවල් දිලික්ත නඩුකර වෙනුවට, විවිධ අවස්ථාවල හානියට පත් වින්දිතයන්ට හානිපූරණය සඳහා විකල්ප ක්‍රමවේද හඳුන්වා දී තිබේ. මෙම විකල්ප හානිපූරණ ක්‍රමවල ස්වභාවය සාකච්ඡා කොට, ඒවා ශ්‍රී ලංකාවේ සන්දර්භයට අදාල වේද, ලංකාව තුල ඒවා සාර්ථක ලෙස ක්‍රියාත්මක කල හැකි ද යන්න සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

***